8-ශ්‍රේණිය

# පරාස්ස

17

❖ නිපුණතාව - රසාඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි .

▪ නිපුණතා මට්ටම - සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනාගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි .

❖ නිපුණතාව -අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයෙහි යෙදෙයි .

▪ නිපුණතා මට්ටම - නාට්‍යපිටපත් රචනයේ යෙදෙයි .



# ක්‍රියාකාරකම - 1

➢ ***පරාස්ස නාට්‍ය ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු තෝරා ලියන්න .***

1.පරාස්ස නාට්‍යයේ අදාළ කොටස රස විඳීමෙන් ගත හැකි ආදර්ශයක් නම් කරන්න .----------------------------------------

2.පරාස්ස නාට්‍යය නිෂ්පාදනය සඳහා පාදක කරගත් කතාව කුමක් ද ?----------------------------------

3. පරාස්ස නාට්‍යය නිෂ්පාදනය සඳහා පාදක කරගත්කතාව ඇතුළත් කෘතිය කුමක් ද ?-------------------------------------

4.පරාස්ස නාට්‍යය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද ?----------------------------------------

5.පරාස්ස නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා නම් කරන්න .---------------------------------

6.පරාස්ස නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා දිනා ගත් සම්මාන යක් නම් කරන්න ?-------------------------------------

7.පරාස්ස නාට්‍යයට සංගීතය සැපයීමෙන් දායක වූයේ කවුද ?----------------------------------------

8.පරාස්ස නට්‍යයේ ඇතුළත් කතාව කුමක් ද ?---------------------------------------------

9.පරාස්ස නාට්‍යය හඳුන්වන වෙනත් නමක් සඳහන් කරන්න .------------------------------------------

10. ඔබ පාඩමට ඇතුළත් වී ඇත්තේ පරාස්ස නාට්‍යයේ කීවැනි අංකය ද ?---------------------------------------------

- **යකුන් බැඳ ගෙන වැඩ ගත් ගැමියෙකුගේ කතාවකි**
- **තැනට සුදුසු ලෙස කටයුතු කිරීමෙන් වාසිදායක තත්වයන් අත්පත් කර ගත හැකි බව .**
- **පස්වන අංකය**
- **රන් කැකිරි හා තවත් කතා**
- **විශාරද රෝහණ බැද්දගේ මහතා**
- **ගමරාල සහ යකා**
- **විමලරත්න අධිකාරී මහතා**
- **රෝහණ දන්දෙණිය මහතා**
- **රනමයුර**
- **රාස්සයන් කන පරාස්සයා**

# ක්‍රියාකාරකම - 2

➢ *පහත දැක්වෙන පාඨයන් කවුරුන් විසින් කහට පවසන ලද්දක්දැයි සොයා ලියන්න .*

1. “ආන්න අරක තමයි ගම උන්නැහේගෙ ගෙදර ” ------------------------------------------
2. “වර, වර , තෝ මොක ද ඔතන ගල්ගැහිලා වගේ ?” ---------------------------------------
3. “මං හිතුවා කීරාලලාගේ දිහා පැළ වුණා කියලා ” ------------------------------------------
4. “අනේ බං ….. උඹැහෙගෙ ඔය ඉවිල්ල , ඕකත් මහ කප්ජක් ද බොලං ” -----------------------------
5. “අනේ බුදු ගම හාමුදුරුවනේ , මාව මරන්ඩ එපා . මගේ පණ කෙන්ද රැක ගෙන යන්ඩ ඉඩ අරින්න ….” -------------
6. “අනේ බුදු ගම හාමුදුරුවනේ , මම මේ කිසි දේකට සම්බන්ද නෑ ”----------------------

කාලහීෂණ විසින් පූර්ණකට

පූර්ණක විසින් කාලහීෂණට

පූර්ණක විසින් පුංචිරාලට

පුංචිරාල විසින් පුරංසිනාට

කාලහීෂණ විසින් පුංචිරාලට

පුරංසිනා විසින් පුංචිරාලට

# ක්‍රියාකාරකම - 3

- ***ගැළපෙන සේ වෙන් කරන්න .***

1. “අකුණු හඬ සේ ගසන බෙර පද තාලයට පා තබාලා “
2. “නර පණුවෙක් ”
3. “ගල්ගැහිලා ”
4. “ගම මායියා ”
5. “යකෙක් කන්න බඩගිනි ”
6. “දොළදුක් ”
7. “ඕකත්මහ කජ්ජක් ද ”
8. “බලු කුක්කෙක් වගේ හැංගිලා ඉන්න හැටි ”
9. “පණ කෙන්ද ”
10. “කිරිගහට ඇන්නා වගෙ “
11. “බේරිලා තියෙන්නේ අනුනවයෙන් ”
12. “රජ ගෙදර පරවියො ”

උපමා

ඉඟි වැකි

ගැමි වහර

# ක්‍රියාකාරකම - 4

➢ ***පහත A තීරුවේ දක්වා ඇති පදවල අර්ථ B තීරුවෙන් සොයා යා කරන්න .***

| | ***A*** | ***B*** |
|---|---|---|
| 1. | නරං | පරම්පරාව |
| 2. | ගම මායියා | ඔබේ |
| 3. | නස්පැත්තිය | ප්‍රදේශය |
| 4. | බොටුව | කැපෙන බව |
| 5. | තීක්ෂ්ණ | මිනිසුන් |
| 6. | කැණහිල් | ගම හාමිනේ |
| 7. | උඹැහැගෙ | රඟහල |
| 8. | මුවහත | හේතුවක් නැතිව |
| 9. | ගාටනවා | සියුම් |
| 10. | ප්‍රේක්ෂාගාරය | හිවලා |
| 11. | වරිගෙ | කරදරය |
| 12. | ඉසව්ව | හෙමින් ගමන |

# ක්‍රියාකාරකම - 5

➢ පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න .

ගැමි නාට්‍ය , වීදි නාට්‍ය,රූපවාහිනී නාට්‍ය , ගුවන්විදුලි නාට්‍ය , වේදිකා නාට්‍ය යනුවෙන් නාට්‍ය වර්ග කිහිපයකි .

වේදිකා නාට්‍යක් යනු 'කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් නළු නිළියන් මාර්ගයෙන් සතර අභිනය භාවිතයෙන්ප්‍රේක්ෂකයන් ඉදිරියේ අපූර්වත්වයෙන් යුතුව නිරූපණය කිරීමයි ' යනුවෙන් භරත මුනි පඬිවරයා තම නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථයේ පෙන්වා දී ඇත .

අභිනය යනු නාට්‍ය පෙළක් රංගනයක් ලෙස ප්‍රේක්ෂකයා ඉදිරියට ගෙන යාම සඳහානළුනිළියන් විසින් යොදා ගනු ලබන ශිල්ප ක්‍රමයි .අභිනය සතරකි , ඒවානම් වාචික ,ආංගික , සාත්වික සහ ආහාර්‍ය යි .

නාට්‍යක් නිර්මාණය කිරීමේදී , නාට්‍යට උචිත අවස්ථා තෝරාගෙන නරඹන්නාගේ සිත කුතුහලයෙන් පුරවා ලිය යුතුයි .නාට්‍යයේ එන චරිතවලට ගැළපෙන වචන භාවිත කිරීමටද නිර්මාණකරුවා සමත් විය යුතුයි .

1. නාට්‍ය වර්ග නම් කරන්න .
2. භරත මුනි පඬිවරයාට අනුව නාට්‍යක් යනු කුමක් ද ?
3. ' අභිනය ' ලෙස හඳුන්වනු ලබන්නේ කුමක් ද ?
4. සතර අභිනය නම් කරන්න .
5. නාට්‍යක් නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් සඳහන් කරන්න

# ක්‍රියාකාරකම - 1
# පිළිතුරු



1.පරාස්ස නාට්‍යයේ අදාළ කොටස රස විඳීමෙන් ගත හැකි ආදර්ශයක් නම් කරන්න .-**තැනට සුදුසු ලෙස කටයුතු කිරීමෙන් වාසිදායක තත්වයන් අත්පත් කර ගත හැකි බව .**

2.පරාස්ස නාට්‍යය  නිෂ්පාදනය සඳහා පාදක කරගත් කතාව කුමක් ද ? **ගමරාල සහ යකා**

3. පරාස්ස නාට්‍යය  නිෂ්පාදනය සඳහා පාදක කරගත්කතාව ඇතුළත් කෘතිය කුමක් ද ?-**රන් කැකිරි හා තවත් කතා**

4.පරාස්ස නාට්‍යය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද ? **රෝහණ දන්දෙණිය මහත**

5.පරාස්ස නාට්‍යයේ  අධ්‍යක්ෂකවරයා  නම් කරන්න . **විමලරත්න අධිකාරී මහත**

6.පරාස්ස නාට්‍යයේ  අධ්‍යක්ෂකවරයා දිනා ගත් සම්මාන යක් නම් කරන්න ? **රනමයුර**

7.පරාස්ස නාට්‍යයට සංගීතය සැපයීමෙන් දායක වූයේ කවුද ? **විශාරද රෝහණ බැද්දගේ මහතා**

8.පරාස්ස නටයයේ එන කතාව කුමක් ද ? **යකුන් බැඳ ගෙන වැඩ ගත් ගැමියෙකුගේ කතාවකි**

9.පරාස්ස නාට්‍යය හඳුන්වන වෙනත් නමක් සඳහන් කරන්න . **රාස්සයන් කන පරාස්සයා**

10. ඔබ පාඩමට ඇතුළත් වී ඇත්තේ පරාස්ස නාට්‍යයේ කීවැනි අංකය ද ? **පස්වන අංකය**

# ක්‍රියාකාරකම - 2
# පිළිතුරු



1. පූර්ණක විසින් කාලභීෂණට

2. කාලභීෂණ විසින් පූර්ණකට

3. පුරංසිනා විසින් පුංචිරාලට

4. පුංචිරාල විසින් පුරංසිනාට

5. කාලභීෂණ විසින් පුංචිරාලට

6. පූර්ණක විසින් පුංචිරාලට

# ක්‍රියාකාරකම - 3
# පිළිතුරු

1.“අකුණු හඬ සේ ගසන බෙර පද තාලයට පා තබාලා
2. “බලු කුක්කෙක් වගේ හැංගිලා ඉන්න හැටි ”

**උපමා**

1.“නර පණුවෙක් ”
2.“ගම මායියා ”
3.“දොළදුක් ”
4.“පණ කෙන්ද ”

**ගැමි වහර**

5.“ගල්ගැහිලා ”
6.“යකෙක් කන්න බඩගිනි ”
7.“ඕකත්මහ කජ්ජක් ද ”
8.“කිරිගහට ඇන්නා වගෙ “
9.“බෙරිලාතියෙන්නේ අනුනවයෙන් ”
10.“රජ ගෙදර පරවියො ”

**ඉඟි වැකි**

# ක්‍රියාකාරකම - 4
# පිළිතුරු



| *A* | | *B* |
|---|---|---|
| 1. | නරං | පරම්පරාව |
| 2. | ගම මායියා | ඔබේ |
| 3. | නස්පැත්තිය | ප්‍රදේශය |
| 4. | බොටුව | කැපෙන බව |
| 5. | තීක්ෂණ | මිනිසුන් |
| 6. | කැණහිල් | ගම හාමිනේ |
| 7. | උඹැහැගෙ | රඟහල |
| 8. | මුවහත | බෙල්ල |
| 9. | ගාටනවා | සියුම් |
| 10. | ප්‍රේක්ෂාගාරය | හිවලා |
| 11. | වරිගෙ | කරදරය |
| 12. | ඉසව්ව | හෙමින් ගමන |

# ක්‍රියාකාරකම - 5
# පිළිතුරු



1. නාට්‍ය වර්ග නම් කරන්න . **ගැමි නාට්‍ය , වීදි නාට්‍ය,රූපවාහිනි නාට්‍ය , ගුවන්විදුලි නාට්‍ය , වේදිකා නාට්‍ය**
2. භරත මුනි පඬිවරයාට අනුව නාට්‍යක් යනු කුමක් ද ? **කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් නළු නිළියන්මාර්ගයෙන් සතර අභිනය භාවිතයෙන්ප්‍රේක්ෂකයන් ඉදිරියේ අපූර්වත්වයෙන් යුතුව නිරූපණය කිරීමයි**
3. ‘ අභිනය ’ ලෙස හඳුන්වනු ලබන්නේ කුමක් ද ? **නාට්‍ය පෙළක් රංගනයක් ලෙස ප්‍රේක්ෂකයා ඉදිරියට ගෙන යාම සඳහානළුනිළියන් විසින් යොදා ගනු ලබන ශිල්ප ක්‍රමය**
4. සතර අභිනය නම් කරන්න . **වාචික ,ආංගික , සාත්වික සහ ආහාර්‍ය යි**
5. නාට්‍යක් නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් සඳහන් කරන්න .**නාට්‍යයේ එන චරිතවලට ගැළපෙන වචන භාවිත කිරීම**